OL/2024(2025)/60-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II |
| Business and Accounting Studies | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'ඉකොවෙජි', එළවළු සහ පලතුරු වගා කරන ගොවීන් 50 දෙනෙකුගෙන් සමන්විත කදුරුහේන ග්‍රාමයේ පිහිටි ආදර්ශ ගොවිපළකි. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට ඇති දුර නිසා ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදිත නැවුම්ව නියමිත වේලාවට ප්‍රවාහනය කිරීමේ ගැටලුවක් පවතී. එයට විසඳුමක් ලෙස, දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන 'සඳලි එළවළු' ව්‍යාපාරයේ අයිතිකරු වන සංඛ, 'ඉකොවෙජි' ගොවිපළේ ගොවීන් සමඟ එක්ව ඔවුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා 'සහන සේවා සංගමය' ආරම්භ කරන ලදී.

**1.** 'සහන සේවා සංගමය' සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(1) ආහාර
(2) සෞඛ්‍යය
(3) ප්‍රවාහනය
(4) ආරක්ෂාව

**2.** 'සඳලි එළවළු' ව්‍යාපාරය
(1) තේවල ස්වාමි ව්‍යාපාරයකි.
(2) හවුල් ව්‍යාපාරයකි.
(3) සමිති සංවිධානයකි.
(4) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

**3.** 'සඳලි එළවළු' ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් හා එයට නිදසුනක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) භූමිය - දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය
(2) ශ්‍රමය - සංඛ
(3) ප්‍රාග්ධනය - එළවළු හා පලතුරු තොග
(4) ව්‍යවසායකත්වය - 'ඉකොවෙජි' ගොවිපළේ ගොවීන්

**4.** 'සඳලි එළවළු' ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධකයක් වන්නේ
(1) සංඛ ය.
(2) ගොවීන් ය.
(3) 'ඉකොවෙජි' ගොවිපළ ය.
(4) දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ය.

**5.** ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 'සඳලි එළවළු' ව්‍යාපාරය ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
(2) 'සහන සේවා සංගමයට' නෛතික පුද්ගලභාවයක් ඇත.
(3) සංඛ, 'ඉකොවෙජි' ගොවිපළේ ඇල්මැති පාර්ශ්වයක් නොවේ.
(4) දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- පහත තොරතුරු භාවිතයෙන් අංක **6** සහ **7** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විදුලි උපකරණ අලෙවි කරන 'මෝටෙක්' ව්‍යාපාරය අසල සමාන නිෂ්පාදිත අඩු මිලට අලෙවි කරන නව වෙළෙඳසැලක් ස්ථාපිත කිරීම නිසා 'මෝටෙක්' ව්‍යාපාරය ගැටලුවකට මුහුණ දී සිටී. මේ නිසා 'මෝටෙක්' ව්‍යාපාරයේ අයිතිකරු පෞද්ගලික විකුණුම් වැඩසටහනක් හඳුන්වාදෙන ලදී.

**6.** 'මෝටෙක්' ව්‍යාපාරයට බලපාන බාහිර පරිසර සාධකය කුමක් ද?
(1) සැපයුම්කරුවෝ (2) තරඟකරුවෝ
(3) කළමනාකරුවෝ (4) සේවකයෝ

**7.** මෝටෙක් ව්‍යාපාරයේ, අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන ප්‍රවර්ධනයට නිදසුනක් වන්නේ
(1) විදුලි උපකරණ අලෙවි කිරීම ය. (2) විදුලි උපකරණ අඩු මිලට මිල කිරීම ය.
(3) නව වෙළෙඳසැලක් ස්ථාපිත කිරීම ය. (4) පෞද්ගලික විකුණුම් වැඩසටහනක් හඳුන්වාදීම ය.

**8.** හිමිකාරත්වය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ
(1) පෞද්ගලික සමාගම් ය. (2) රාජ්‍ය සමාගම් ය.
(3) රාජ්‍ය සංස්ථා ය. (4) රාජ්‍ය දෙපාර්තමේන්තු ය.

**9.** ව්‍යාපාරයකට බලපාන ආර්ථික පරිසර සාධකය කුමක් ද?
(1) නව සැපයුම්කරුවකුගෙන් අමුද්‍රව්‍ය මිල දී ගැනීම
(2) ශ්‍රී ලංකා රජය විසින් බදු අනුපාත ඉහළ නැංවීම
(3) ටෙක් ලංකා ආයතනය විසින් නව ගිණුම්කරණ මෘදුකාංගයක් හඳුන්වා දීම
(4) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා නව ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම

**10.** චෙක්පත්වලින් ගනුදෙනු කිරීම සඳහා ① .............................. ගිණුමක් අවශ්‍ය වන අතර, ② .............................. චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත නොහැකි ය.
ඉහත ① හා ② හිස්තැන් සඳහා නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඉතිරිකිරීමේ, පිටසන් කළ (2) ජංගම, පිටසන් කළ
(3) ඉතිරිකිරීමේ, රේඛිත (4) ජංගම, රේඛිත

**11.** සුගත්, ගම්පහ බස් නැවතුම්පොළෙන් සිසු සැරිය බස් රථයට නැගී, පාසල වෙත යයි.
ඉහත ප්‍රකාශයේ සඳහන් ගම්පහ බස් නැවතුම්පොළ හා සිසු සැරිය බස් රථය අයත් වන ප්‍රවාහන මූලිකාංග පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මාධ්‍යය, පර්යන්තය (2) බලය, පර්යන්තය
(3) බලය, මාධ්‍යය (4) පර්යන්තය, මාධ්‍යය

**12.** රක්ෂණ හිමිකම මූලධර්මය හා සම්බන්ධ සිදුවීම තෝරන්න.
(1) උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන අමර, උකස් භාණ්ඩ රක්ෂණය කිරීම
(2) රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීම සඳහා කුමාරි තමාගේ සම්පූර්ණ වෛද්‍ය ඉතිහාසය ලබා දීම
(3) සරත්ට ඔහුගේ කාර් රථයට සිදු වූ අලාභයේ ප්‍රමාණය සඳහා පමණක් වන්දි ලැබීම
(4) සමහර තොරතුරු අනාවරණය නොකිරීම නිසා විමල්ගේ රක්ෂණ ඔප්පුව ප්‍රතික්ෂේප වීම

**13.** නිෂ්පාදන කළමනාකරු විසින් සැපයුම්කරුවකු වන කමල් වෙත ඉතා ඉක්මනින් අමුද්‍රව්‍ය අවශ්‍ය බව දන්වා ඇණවුමක් යවා ඇත.
ඉහත ප්‍රකාශයේ ඇතුළත් සන්නිවේදන මූලිකාංග වන්නේ
(1) පණිවුඩය, ප්‍රතිචාරය හා ප්‍රතිපෝෂණයයි. (2) යවන්නා, ලබන්නා හා පණිවුඩයයි.
(3) මාධ්‍යය, ලබන්නා හා ප්‍රතිපෝෂණයයි. (4) යවන්නා, ලබන්නා හා ප්‍රතිචාරයයි.

**14.** පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ සංවිධායක කමිටුව සිදු කළ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.
**A** - දිනපතා ක්‍රීඩා පුහුණුවීම් කටයුතුවල සිසුන් යෙදවීම
**B** - නිවාස නායකයින් හා ක්‍රීඩා නායකයින් පත් කිරීම
**C** - වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උළෙල මාර්තු මස අවසානයේ දී පැවැත්වීමට තීරණය කිරීම
**D** - ත්‍යාග හා කුසලාන සඳහා අවශ්‍ය අරමුදල් පාසල් සංවර්ධන සමිති අරමුදලෙන් වෙන් කිරීම
ඉහත ක්‍රියාකාරකම් අතුරෙන්, කළමනාකරණ ක්‍රියාවලියේ සංවිධානකරණය හා මෙහෙයවීම පිළිවෙළින් දැක්වෙන්නේ
(1) B හා A මගිනි. (2) B හා D මගිනි.
(3) D හා B මගිනි. (4) D හා C මගිනි.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**15.** අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වන මිල හා ස්ථානය ඇතුළත් ප්‍රකාශය තෝරන්න.
(1) KG ටී-ෂර්ට්, මංගත (online) විකුණුම් මගින් 30% ක ඉහළ ලාභාන්තිකයක් උපයා ඇත.
(2) ශක්ති හෝම්ස් නව නිවාස ආකෘති ප්‍රවර්ධනයට පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී.
(3) ආයතනයක් ජාත්‍යන්තර සමුළුවක දී නවාතැන් වෙන්කිරීම සඳහා නව මෘදුකාංගයක් ඉදිරිපත් කර ඇත.
(4) කුමාර විසින් නිෂ්පාදිත ටින් මාළුවල නියැදි නොමිලේ බෙදාහරින ලදී.

**16.** කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගමක සාමාන්‍ය කොටස්වල සහ බැංකුවක ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ප්‍රාග්ධන ලාභ සහ ලාභාංශ
(2) පොලී ආදායම් සහ ප්‍රාග්ධන ලාභ
(3) පොලී ආදායම් සහ ලාභාංශ
(4) ප්‍රාග්ධන ලාභ සහ පොලී ආදායම්

**17.** ගිණුම්කරණ ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ
(1) ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කිරීම ය.
(2) ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම ය.
(3) ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන රැස්කර ගැනීම ය.
(4) ගනුදෙනුවලට අදාළ ලෙජර් ගිණුම් හඳුනාගැනීම ය.

**18.** ව්‍යාපාරයක ජංගම නොවන වගකීමක් ඇති කරනු ලබන ගනුදෙනුව කුමක් ද?
(1) ණයහිමියකුට රු. 15 000 ක් ගෙවීම
(2) කාර්යාලය සඳහා රු. 200 000 ක ලී බඩු අත්පිට මුදලට ගැනීම
(3) රු. 500 000 ක දිගුකාලීන බැංකු ණයක් ලබා ගැනීම
(4) විකිණීම සඳහා රු. 50 000 ක භාණ්ඩ ණයට ගැනීම

**19.** ව්‍යාපාරයේ භාවිතය සඳහා රු. 250 000 ක උපකරණ ණයට ගැනීම සටහන් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වන්නේ
(1) ගැනුම් ඉන්වොයිසිය හා ගැනුම් ජර්නලයයි.
(2) ගෙවීම් වවුචරය හා මුදල් පොතයි.
(3) ජර්නල් වවුචරය හා පොදු ජර්නලයයි.
(4) ගැනුම් ඉන්වොයිසිය හා පොදු ජර්නලයයි.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **20** සිට **23** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2025.01.01 දිනට රවීන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන පරිදි විය.

| **වත්කම්** | = | **හිමිකම්** | + | **වගකීම්** |
|---|---|---|---|---|
| රු. 200 000 | | රු. 120 000 | | රු. 80 000 |

රවීන්ගේ ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසයේ පළමු සතිය තුළ පහත සඳහන් ගනුදෙනු සිදු විය.

**A** - රු. 50 000 ක භාණ්ඩ ණයට ගැනීම
**B** - රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම
**C** - කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු. 150 000 ක ලී බඩු අත්පිට මුදලට ගැනීම
**D** - රු. 10 000 ක් වූ රවීන්ගේ ජීවිත රක්ෂණ වාරිකය ව්‍යාපාරයේ මුදලින් ගෙවීම

**20.** රවීන්ගේ ව්‍යාපාරයේ 2025.01.01 දිනට ගිණුම්කරණ සමීකරණයේ අගයන් වෙනස් **නොකරන** ගනුදෙනුව වන්නේ
(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.

**21.** මෙම ගනුදෙනුවලින් පසුව, රවීන්ගේ ව්‍යාපාරයේ හිමිකම වන්නේ
(1) රු. 220 000 කි.
(2) රු. 210 000 කි.
(3) රු. 120 000 කි.
(4) රු. 110 000 කි.

**22.** මෙම ගනුදෙනුවලින් රවීන්ගේ ව්‍යාපාරයේ වත්කම් වැඩි වන්නේ
(1) රු. 140 000 කිනි.
(2) රු. 150 000 කිනි.
(3) රු. 290 000 කිනි.
(4) රු. 340 000 කිනි.

**23.** මෙම ගනුදෙනුවලින් රවීන්ගේ ව්‍යාපාරයේ වගකීම්වලට බලපාන ගනුදෙනු මොනවා ද?
(1) A හා B
(2) A හා D
(3) B හා C
(4) C හා D

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**24.** ව්‍යාපාරයක 2024.12.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 250 ක් විය. 2025.01.01 දින සිට සුළු මුදල් අග්‍රිමය රු. 2 000 කින් වැඩි කිරීම නිසා එදින සුළු මුදල් ප්‍රතිපූර්ණය සඳහා රු. 4 750 ක් ලැබුණි. 2024 දෙසැම්බර් මාසයේ සුළු මුදල් වියදම වන්නේ

(1) රු. 5 000 කි. (2) රු. 4 750 කි.
(3) රු. 3 000 කි. (4) රු. 2 750 කි.

**25.** 2024.12.31 දිනට ව්‍යාපාරයක බැංකු ගිණුමේ ශේෂය රු. 15 200 ක් විය. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 18 000 ක් විය. මෙම වෙනසට බලපා ඇත්තේ එක් හේතුවක් පමණි. එම හේතුව කුමක් ද?

(1) ණයගැතියකු විසින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සෘජුව ම තැන්පත් කළ මුදල රු. 2 800 කි.
(2) බැංකුවේ තැන්පත් කළ නමුත් දෙසැම්බර් මාසය තුළ උපලබ්ධි නොවූ චෙක්පත රු. 2 800 කි.
(3) ස්ථාවර නියෝගයක් මත බැංකුව ගෙවා ඇති රක්ෂණ වාරිකය රු. 2 800 කි.
(4) බැංකුව අයකරගත් බැංකු ගාස්තුව රු. 2 800 කි.

**26.** ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සහ බැංකු ප්‍රකාශනයේ යන දෙකෙහි ම ඇතුළත් ගනුදෙනුව තෝරන්න.

(1) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 100 000
(2) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 25 000
(3) ව්‍යාපාරය විසින් නිකුත් කළ බැංකුව මුදල් ගෙවූ චෙක්පත රු. 5 000
(4) අත්පිට විකුණුම් සඳහා ව්‍යාපාරයට ලැබුණු චෙක්පත රු. 25 000

**27.** 2025.01.05 දින සුරාජ් රු. 10 000 ක භාණ්ඩ ණයට ගැනීමේ දී 10% ක වට්ටමක් ලැබුණි. මාසයක් ඇතුළත මුදල් ගෙවන්නේ නම් 5% ක වට්ටමක් දෙන බව ද ඉන්වොයිසියේ සඳහන් විය. 2025.01.25 දින සුරාජ් විසින් මුදල් ගෙවන ලදී. එදින, ලද වට්ටම් ගිණුමට බැර කළ යුතු මුදල වන්නේ

(1) රු. 450 කි. (2) රු. 500 කි. (3) රු. 1 000 කි. (4) රු. 1 450 කි.

**28.** 2024.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 12 000 කින් වැඩි වී ඇත. මෙයට බලපෑ ගනුදෙනුව වන්නේ

(1) වැටුප් ගිණුමේ ශේෂය රු. 6 000 ක් ශේෂ පිරික්සුමේ දෙවරක් සටහන් වීම ය.
(2) විකුණුම් ගිණුමේ එකතුව රු. 12 000 කින් අඩු වීම ය.
(3) ගැනුම් ගිණුමේ එකතුව රු. 12 000 කින් අඩු වීම ය.
(4) ගොඩනැගිලි ගිණුමේ ශේෂය රු. 12 000 ක් ශේෂ පිරික්සුමේ බැර තීරුවේ ඇතුළත් වීම ය.

**29.** ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපෑමක් ඇති **නොකරන** ගිණුම්කරණ වරද කුමක් ද?

(1) ලී බඩු ගැනුම් රු. 10 000, ගැනුම් ගිණුමට හර කිරීම
(2) ණය හිමියන්ට ගෙවූ රු. 10 000, මුදල් ගිණුමේ පමණක් සටහන් වීම
(3) අත්පිට ගැනුම් රු. 10 000, ගැනුම් ගිණුමේ බැර පැත්තේ සටහන් වීම
(4) ඉඩම් ගිණුමේ ශේෂය රු. 100 000, ශේෂ පිරික්සුමට උපුටා නොගැනීම

- පහත තොරතුරු භාවිතයෙන් අංක **30** සහ **31** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුභසාධක සංගමයක සිටින සාමාජිකයින් සංඛ්‍යාව 120 කි. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී, එම වර්ෂය සඳහා ලැබුණු සාමාජික මුදල රු. 120 000 කි. 2024.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල රු. 24 000 කි.

**30.** එක් සාමාජිකයකුගේ මාසික සාමාජික මුදල වන්නේ

(1) රු. 100 කි. (2) රු. 120 කි. (3) රු. 1 000 කි. (4) රු. 1 200 කි.

**31.** 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ හා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල පිළිවෙළින්

(1) රු. 24 000 හා රු. 120 000 ය. (2) රු. 120 000 හා රු. 24 000 ය.
(3) රු. 144 000 හා රු. 120 000 ය. (4) රු. 144 000 හා රු. 24 000 ය.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

81728



- පහත තොරතුරු භාවිතයෙන් අංක **32** සහ **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෙදර් සපත්තු නිෂ්පාදන ආයතනයක සපත්තු ජෝඩු 500 ක් නිෂ්පාදනය කිරීම සඳහා පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| **A** - | සම් මිල දී ගැනීම | 75 000 |
| **B** - | නූල්, ගම්, ඉඳිකටු හා වෙනත් ද්‍රව්‍ය ගැනුම් | 2 000 |
| **C** - | සපත්තු මැසීමේ කුලිය | 35 000 |
| **D** - | සපත්තු අඩි මිලට ගැනුම් | 10 000 |
| **E** - | සපත්තු මහන මැෂින් ක්ෂය වීම | 3 000 |
| **F** - | නව සපත්තු මහන මැෂිමක් මිලට ගැනීම | 40 000 |
| **G** - | සපත්තු මෝස්තර නිර්මාණ ගාස්තුව | 6 000 |

**32.** සපත්තු ජෝඩුවක සෘජු ද්‍රව්‍ය පිරිවැය

(1) රු. 150 කි. (2) රු. 154 කි. (3) රු. 170 කි. (4) රු. 174 කි.

**33.** නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙහි ඇතුළත් අයිතම වන්නේ

(1) A හා B ය. (2) B හා D ය. (3) B හා E ය. (4) C හා E ය.

- පහත සඳහන් තොරතුරු භාවිත කරමින් අංක **34** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැම්සන් 2024.01.01 දින රු. 100 000 ක් යොදා, කුලියට ගත් ගොඩනැගිල්ලක ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එම ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| **2024.12.31 දිනට වත්කම් :** | | |
| බැංකු ශේෂය | - | 44 000 |
| ණයගැතියෝ | - | 86 000 |
| මුදල් ශේෂය | - | 125 000 |
| යන්ත්‍ර හා උපකරණ | - | 250 000 |
| අයිතිකරු යෙදූ බෙදාහැරීමේ ලොරි රථය (පිරිවැය 2024.01.01 දිනට) | - | 800 000 |
| **2024.12.31 දිනට වගකීම් :** | | |
| 10% බැංකු ණය මුදල (2024.01.01 දින ලබාගත්) | - | 100 000 |
| ණයහිමියෝ | - | 42 500 |
| **ආදායම් :** | | |
| අත්පිට මුදලට විකුණුම් | - | 350 000 |
| ණයට විකුණුම් | - | 370 000 |
| අමතර ආදායම් | - | 80 000 |
| **වියදම් :** | | |
| ගොඩනැගිලි කුලී ගෙවීම් | - | 30 000 |
| විදුලි ගාස්තු ගෙවීම් | - | 60 000 |
| අත්පිට ගැනුම් | - | 340 000 |
| ණයට ගැනුම් | - | 100 000 |
| ණය පොලී ගෙවීම් | - | 7 500 |

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**අතිරේක තොරතුරු :**

1. බෙදාහැරීමේ ලොරි රථය වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.
2. 2024.12.31 දිනට ඉතිරි තොග කිසිවක් නොවී ය.
3. ණයගැතියන්ගෙන් රු. 6 000 ක් බොල් ණය ලෙස කපා හැරිය යුතු ය.

**34.** 2024.01.01 දින සැම්සන් ව්‍යාපාරයට යෙදූ ප්‍රාග්ධනය

(1) රු. 100 000 කි. (2) රු. 200 000 කි. (3) රු. 800 000 කි. (4) රු. 900 000 කි.

**35.** සැම්සන්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය

(1) රු. 340 000 කි. (2) රු. 380 000 කි. (3) රු. 440 000 කි. (4) රු. 720 000 කි.

**36.** සැම්සන්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය

(1) රු. 280 000 කි. (2) රු. 340 000 කි. (3) රු. 360 000 කි. (4) රු. 380 000 කි.

**37.** 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන බැංකු ණය පොලී වටිනාකම

(1) රු. 2 500 කි. (2) රු. 7 500 කි. (3) රු. 10 000 කි. (4) රු. 17 500 කි.

**38.** 2024.12.31 දිනට මෙම ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන නිවැරදි අයිතමයක් වන්නේ

(1) උපචිත බැංකු ණය පොලී රු. 10 000 ය.
(2) ණයගැති ශේෂය රු. 86 000 ය.
(3) බෙදාහැරීමේ ලොරි රථයේ ශුද්ධ අගය රු. 720 000 ය.
(4) බැංකු ණය රු. 90 000 ය.

**39.** 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්වල එකතුව

(1) රු. 6 000 කි. (2) රු. 80 000 කි. (3) රු. 86 000 කි. (4) රු. 96 000 කි.

**40.** 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සැම්සන්ගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය

(1) රු. 94 000 කි. (2) රු. 174 000 කි. (3) රු. 274 000 කි. (4) රු. 360 000 කි.

* *

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
# General Certificate of Education (Ord. Level) Examination, 2024 (2025)

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**උපදෙස්:**

- ✳ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✳ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක **(i)** සිට **(x)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අත්කම් නිර්මාණ පිළිබඳ ඩිප්ලෝමාධාරියකු වූ කල්හාර, සංචාරක පාරාදීසයක් වූ නිල්වැල්ල ග්‍රාමයේ වාසය කරයි. කල්හාර ඔහුගේ පියා විසින් පවත්වාගෙන යන ලද අත්කම් නිර්මාණ ව්‍යාපාරය නවීකරණය කර, 'කල්හාර අත්කම්' නමින් නව ව්‍යාපාරයක් 2025.01.01 දින ආරම්භ කරන ලදී. එදිනට කල්හාරගේ පියාගේ ව්‍යාපාරයේ විකිණීමට සූදානම් කර තිබූ වටිනාකම රු. 250 000 ක් වූ අත්කම් නිර්මාණ සහ රු. 100 000 ක් වූ යන්ත්‍ර හා උපකරණ ද පියා විසින් ඔහුට ලබා දෙන ලදී. එදින ම කල්හාර 12% ක වාර්ෂික පොලියකට රු. 200 000 ක බැංකු ණය මුදලක් ලබාගත් අතර, ඔහු සතුව තිබූ රු. 150 000 ක් වූ නවීන උපකරණ ද යොදවන ලදී.

2025.01.31 දිනෙන් අවසන් මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය ණයට ගැනුම් | 180 000 |
| ගෙනඒමේ කුලී ගෙවීම | 10 000 |
| ණයහිමියන්ට ගෙවීම | 50 000 |
| සේවක වැටුප් ගෙවීම | 80 000 |
| බෙදාහැරීමේ රථ ගාස්තු ගෙවීම | 30 000 |
| අත්පිට විකුණුම් | 400 000 |
| ණයට විකුණුම් | 200 000 |

කල්හාර තම නිෂ්පාදිත ඔහුගේ ප්‍රදර්ශනාගාරයේ දී දේශීය හා විදේශීය සංචාරකයින්ට විකුණයි. තව ද සංචාරකයින්ට අලෙවි කිරීම සඳහා තම නිෂ්පාදිත ප්‍රදේශයේ ඇති සංචාරක නිකේතනවලට ද බෙදාහරියි. 'කල්හාර අත්කම්' ප්‍රදර්ශනාගාර ශ්‍රී ලංකාවේ වෙනත් සංචාරක නගරවල ද ඉදිරි වසරේ දී විවෘත කිරීමට කල්හාර තීරණය කර ඇත.

**අමතර තොරතුරු:**

- 2025 ජනවාරි මාසය සඳහා විදුලි බිල රු. 8 000 ක් මෙතෙක් ගෙවා නැත.
- ජංගම නොවන වත්කම් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 12% බැගින් ක්ෂය කරයි.

(i) (අ) 'කල්හාර අත්කම්' ව්‍යාපාරය හිමිකාරිත්වය අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.

(ii) 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ සිදුවන සිල්ලර වෙළෙඳාමකට හා තොග වෙළෙඳාමකට නිදසුන බැගින් ලියන්න.

(iii) (අ) 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ ඉලක්ක වෙළෙඳපොළ කුමක් ද?

(ආ) 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ සිදු කළ පහත එක් එක් දෑ අයත්වන කළමනාකරණ කාර්යය ලියන්න.

1. ව්‍යාපාරය සඳහා බැංකු ණයක් ලබා ගැනීම
2. වෙනත් නගරවල ප්‍රදර්ශනාගාර විවෘත කිරීමට තීරණය කිරීම

(iv) 'කල්හාර අත්කම්' ව්‍යාපාරය කෙරෙහි පහත සඳහන් එක් එක් ඇල්මැති පාර්ශ්වය උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් ලියන්න.

1. විදේශීය සංචාරකයෝ
2. කල්හාර

(v) 2025.01.01 දිනට 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය ලියන්න.

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(vi) 2025.01.01 දින කල්හාර සතු රු. 150 000 ක් වටිනා නවීන උපකරණ ව්‍යාපාරයට යෙදවීම ගිණුම්ගත කිරීමේ ද්විත්ව සටහන ලියන්න.

(vii) (අ) 'කල්හාර අත්කම්' ව්‍යාපාරය පවත්වා ගත යුතු මූලික සටහන් පොත් **දෙකක්** නම් කරන්න.

(ආ) ඉහත (vii) (අ) හි නම් කළ එක් එක් මූලික පොතෙහි සටහන් කරන ඉහත සිද්ධියේ සඳහන් ගනුදෙනුව බැගින් ලියන්න.

(viii) 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ 2025.01.31 දිනට ජංගම වගකීම් **දෙකක්** වටිනාකම් සහිත ව ලියන්න.

(ix) 2025.01.31 දිනට 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල ධාරණ අගය ගණනය කරන්න.

(x) 2025.01.31 දිනට 'කල්හාර අත්කම්' ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

**(ලකුණු 02 × 10 = 20 යි)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අවශ්‍යතා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

(ආ) නිෂ්පාදන සාධකයක් වන ශ්‍රමය ලෙස සලකනු ලබන්නේ සේවකයාගේ කායික දායකත්වය පමණි.

(ඉ) තොග වෙළෙන්දා හා පාරිභෝගිකයා අතර, සිල්ලර වෙළෙන්දා අතරමැදියකු ලෙස කටයුතු කරයි.

(ඊ) සමූපකාර සමිති, ඒවායේ සාමාජිකයන්ගේ සුබසාධනය සඳහා කටයුතු කරයි. (ලකුණු 02 යි)

(iii) සමන් ඉතිරි කරගත් මුදල් යොදවා 'ෂයින් බේකරි' ව්‍යාපාරය පවත්වාගෙන යයි. තරගකාරී වෙළෙඳපොළේ ඉල්ලුම ඉහළ යාම නිසා ව්‍යාපාර කටයුතු ඵලදායී ව පවත්වාගෙන යාමට අත්දැකීම් සහිත රවී, බඳවා ගන්නා ලදී.

(අ) 'ෂයින් බේකරි' ව්‍යාපාරයේ ශක්තීන් **දෙකක්** ලියන්න.

(ආ) 'ෂයින් බේකරි' ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන ඉහත සිද්ධියේ සඳහන් පාර්ශ්ව **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) පහත දැක්වෙන්නේ ගිහාන් ගනුදෙනු කළ ව්‍යාපාර ස්ථාන කිහිපයකි.

**A** – නවීන් පොත් වෙළෙන්දෝ

**B** – ස්මාට් රෙදිපිළි වෙළෙන්දෝ

**C** – මිහිරි බේකර්ස්

(අ) ඉහත එක් එක් ව්‍යාපාරයෙන් ගිහාන් සපුරාගෙන ඇති අවශ්‍යතාව බැගින් වෙන වෙන ම සඳහන් කරන්න.

(ආ) ඉහත වෙළෙඳසැල් අතුරෙන් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් හා සේවා සපයන ව්‍යාපාරයක් නම් කරන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**3.** (i) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ජංගම ගිණුමක තැන්පත් කළ හැක්කේ රේඛිත චෙක්පත් පමණි.

(ආ) ඕනෑම අවදානමක් රක්ෂණය කළ හැකි ය.

(ඉ) ව්‍යාපාර සන්නිවේදනය වැදගත් වන්නේ මහා පරිමාණ ව්‍යාපාරවලට පමණි.

(ඊ) භාණ්ඩයක විකුණුම් මිල තීරණය කිරීමට ප්‍රවාහන පිරිවැය සුවිශේෂී සාධකයකි. (ලකුණු 02 යි)

(iii) නිමල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර තිබූ මුදලින් කොටසක් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. ව්‍යාපාරය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුනිල්ගෙන් මිල දී ගැනීමේ දී ලංකා බැංකුවේ ඇති ගිණුමෙන් චෙක්පතක් නිකුත් කළේ ය.

(අ) ඉහත සිද්ධියේ සඳහන් චෙක්පතෙහි අණකරු හා අණලද්‍ද නම් කරන්න.

(ආ) නිමල් සතු ආයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) පහත සිදුවීම් දෙක සලකන්න.

**සිදුවීම A**

සරත්ගේ නිවසට ගංවතුරෙන් හානි විය. ඔහු මෙම හානිය පිළිබඳ ව තම රක්ෂණ සමාගම වෙත ජංගම දුරකථනයෙන් කෙටි පණිවුඩයක් (SMS) මගින් දැන්වී ය. ඔහු තම ස්වාභාවික ආපදා රක්ෂණ ඔප්පුව මගින් සම්පූර්ණ වන්දි මුදල ලබා ගත්තේ ය.

[නවවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**සිදුවීම B**

සංජය ජීවිත රක්ෂණ ඔප්පුව ලබා ගැනීමේ දී ඔහුගේ වෛද්‍ය ඉතිහාසය නිවැරදි ව අනාවරණය කර නැත. පසුව රෝගාතුර වූ ඔහු, රෝහල් ගත වී වන්දි ඉල්ලා දුරකථන ඇමතුමක් දෙන ලදී. නමුත් රක්ෂණ සමාගම වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත.

(අ) ඉහත A හා B යන එක් එක් සිදුවීම්වල දී වන්දි ගෙවීමට හෝ නොගෙවීමට බලපෑ රක්ෂණ මූලධර්මය සඳහන් කරන්න.

(ආ) ඉහත A හා B යන එක් එක් සිදුවීම්වල භාවිත කර ඇති සන්නිවේදන මාධ්‍යය නම් කරන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**4.** (i) ඉඩම්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අලෙවිකරණ මිශ්‍රය අදාළ වන්නේ භෞතික නිෂ්පාදිතවලට පමණි.

(ආ) ඉතිරිකිරීම් ගිණුම් අනෙකුත් සියලු ම ආයෝජනවලට වඩා ඉහළ ප්‍රතිලාභ ලබාදෙයි.

(ඉ) කළමනාකරණ ක්‍රියාවලියේ පළමු කාර්යය වන්නේ සැලසුම්කරණයයි.

(ඊ) තීරණ ගැනීම සෑම කළමනාකරණ කාර්යයක ම ඇතුළත් වේ. (ලකුණු 02 යි)

(iii) 'ග්‍රීන්වේව්' ශාකසාර නිෂ්පාදිත ව්‍යාපාරයේ අයිතිකරු වන ජීවන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා නව යන්ත්‍රයක් මිල දී ගැනීමට තීරණය කර ඇත. ඔහු නිෂ්පාදන එදායිතාව නිරීක්ෂණය කිරීම සඳහා නිෂ්පාදන සුපරීක්ෂකවරයකු ද බඳවා ගත්තේ ය.

(අ) ඉහත සිද්ධියේ ඇතුළත් කළමනාකරණ කාර්යන් **දෙකක්** ලියන්න.

(ආ) ඉහත (iii) (අ) හි සඳහන් කළ එක් එක් කළමනාකරණ කාර්යය සඳහා සිද්ධියෙහි සඳහන් නිදසුන බැගින් ලියන්න. (ලකුණු 02 යි)

(iv) නුවන්, තමා ඉතිරි කරගත් මුදල්, ස්ථාවර තැන්පතුවක, ඉඩමක හා කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම්වල ආයෝජනය කර ඇත.

(අ) ඉහත ආයෝජනවලින් වැඩි ම අවදානමක් සහිත ආයෝජනය කුමක් ද?

(ආ) ඉහත එක් එක් ආයෝජනයෙන් නුවන්ට ලැබෙන මූල්‍ය ප්‍රතිලාභය බැගින් අනුපිළිවෙළින් ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (i) වත්කමක ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාරයක ගනුදෙනු දෙකක් ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.

| | **වත්කම්** (රු.) | = | **හිමිකම්** (රු.) | + | **වගකීම්** (රු.) |
|---|---|---|---|---|---|
| (1) | - 15 000 (මුදල්) | | | | - 15 000 (ණයහිමියෝ) |
| (2) | - 25 000 (බඩු තොගය ) | | + 5 000 (ලාභය) | | |
| | + 30 000 (මුදල්) | | | | |

**අවශ්‍ය වන්නේ :**

ඉහත සඳහන් ගනුදෙනු **දෙක** ලිවීම

(ආ) සාගරගේ ව්‍යාපාරයේ 2024 වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය (2024.01.01 දිනට) | 500 000 |
| වර්ෂයේ ආදායම | 360 000 |
| වර්ෂයේ වියදම | 210 000 |
| වර්ෂය තුළ සාගර යෙදූ මුදල | 100 000 |

**අවශ්‍ය වන්නේ :**

2024.12.31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කිරීම (ලකුණු 04 යි)

[දහවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(iv) 2025.01.01 දිනට නිසලගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 20 250 ක් විය. 2025 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2025.01.02 - රු. 15 000 ක් බැංකුවේ තැන්පත් කිරීම
2025.01.15 - විදුලි බිල සඳහා රු. 10 000 ක චෙක්පතක් නිකුත් කිරීම
2025.01.18 - විදුලි බිල සඳහා නිකුත් කළ චෙක්පත අගරු වීම
2025.01.27 - ණයහිමි සමීරට රු. 28 500 ක චෙක්පතක් නිකුත් කිරීම. ලද වට්ටම රු. 1 500 කි.

**අවශ්‍ය වන්නේ :**

නිසලගේ ව්‍යාපාරයේ වට්ටම් තීරු සහිත බැංකු ගිණුම පිළියෙල කර 2025.01.31 දිනට බැංකු ශේෂය දැක්වීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

6. (i) ගිණුම්කරණ ක්‍රියාවලියේ දී වැරදි සිදු විය හැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) 'සවිය' නිෂ්පාදන ව්‍යාපාරයේ 2025 වර්ෂය සඳහා කැලැන්ඩර් 1 000 ක් මුද්‍රණය කිරීමට අදාළ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| කඩදාසි හා තීන්ත | 100 000 |
| මුද්‍රණ සේවකයකුගේ මාසික වැටුප | 40 000 |
| (මුද්‍රණ සේවකයින් දෙදෙනෙකු සිටී) | |
| කැලැන්ඩරයේ මෝස්තර නිර්මාණය සඳහා වියදම් | 5 000 |
| මුද්‍රණ යන්ත්‍ර වාර්ෂික ක්ෂය | 24 000 |
| මුද්‍රණ අංශයේ මාසික විදුලි බිල | 8 000 |
| මුද්‍රණ අංශයේ පිරිසිදු කරන්නාගේ මාසික වැටුප | 15 000 |
| ගම්, නූල් හා ඇමුණුම් කටු | 1 000 |
| මුද්‍රණ අංශයේ මුරකරුගේ මාසික වැටුප | 20 000 |

**අවශ්‍ය වන්නේ :**

පිරිවැයට 10% ක ලාභාන්තිකයක් සහිත ව කැලැන්ඩරයක විකුණුම් මිල ගණනය කිරීම (ලකුණු 02 යි)

(iii) හසීම්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතු පහත දැක්වෙන පරිදි විය.

හර තීරුව - රු. 685 000
බැර තීරුව - රු. 750 000

මෙම වෙනසට බලපෑ හේතු පහත පරිදි විය.

1. අත්පිට ගැනුම් රු. 50 000 ක් ගිණුම්වල දෙවරක් සටහන් වීම
2. වැටුප් ගිණුමේ හර පැත්ත රු. 1 000 ක් වැඩියෙන් එකතු වී තිබීම
3. ඉඩම් ගිණුමේ ශේෂය රු. 666 000 ක් ශේෂ පිරික්සුමේ රු. 600 000 ක් ලෙස සටහන් වීම
4. ලී බඩු ගැනුම් රු. 25 000 ක් ගැනුම් ගිණුමට හර කිරීම

**අවශ්‍ය වන්නේ :**

ඉහත වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් ලිවීම (ලකුණු 04 යි)

(iv) රිස්නාගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 45 000 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 36 000 ක් විය. මෙම වෙනසට බලපෑ හේතු පහත දැක්වේ.

1. දෙසැම්බර් මස බැංකුවේ තැන්පත් කළ අංක 700750 දරණ රු. 24 000 ක් වටිනා චෙක්පත උපලබ්ධි වී නොමැත.
2. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ රක්ෂණ වාරිකය රු. 6 000 කි.
3. අංක 820004 දරණ රු. 10 000 ක චෙක්පත ණයහිමියකුට නිකුත් කර ඇතත්, එය බැංකුවට ඉදිරිපත් කර නොමැත.
4. ණයගැතියකුගෙන් සෘජුව ම බැංකුවට ලද මුදල රු. 11 000 කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2024.12.31 දිනට රිස්නාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම
(ආ) 2024.12.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

[එකළොස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

7. (i) යන්ත්‍රයක සුන්බුන් වටිනාකම යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) රන්තරු ක්‍රීඩා සමාජයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

- සාමාජිකයින් සංඛ්‍යාව 80 කි.
- සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1 000 කි.
- සාමාජිකයින් පස්දෙනකු වාර්ෂික සාමාජික මුදල් ගෙවා නැත.
- රු. 50 000 ක ක්‍රීඩා උපකරණ පරිත්‍යාග ලෙස ක්‍රීඩා සමාජයට ලැබී ඇත.
- ක්‍රීඩාගාරය භාර සේවකයාගේ මාසික වැටුප රු. 10 000 කි. 2024 දෙසැම්බර් මාසය සඳහා ඔහුට වැටුප් ගෙවා නොමැත.
- ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් ලැබීම් රු. 100 000 කි. 2024.12.31 දිනට ලැබිය යුතු කුලිය රු. 10 000 කි.

**අවශ්‍ය වන්නේ :**
2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන රන්තරු ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කරන අයිතම **දෙකක්** වටිනාකම් සහිත ව ලිවීම (ලකුණු 02 යි)

(iii) සාරධාගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2024.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 455 000 |
| තොගය (2024.01.01 දිනට) | 58 000 | |
| 8% බැංකු ණය | | 50 000 |
| ණයගැතියෝ | 45 000 | |
| ණයහිමියෝ | | 51 000 |
| ගැනුම් | 375 000 | |
| විකුණුම් | | 590 000 |
| ගෙනඒමේ කුලී | 22 000 | |
| ගොඩනැගිලි කුලී | 10 000 | |
| විකුණුම් සේවක වැටුප් | 90 000 | |
| විදුලි ගාස්තු | 50 000 | |
| දුන් වට්ටම් | 12 000 | |
| ලද වට්ටම් | | 15 000 |
| බෙදාහැරීමේ රථ (2024.01.01 දිනට පිරිවැය) | 400 000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2024.01.01 දිනට) | | 64 000 |
| ණය පොලී | 2 000 | |
| බැංකු ගාස්තු | 1 500 | |
| යන්ත්‍ර හා උපකරණ (2024.01.01 දිනට පිරිවැය) | 150 000 | |
| මුදල් ශේෂය | 9 500 | |
| | 1 225 000 | 1 225 000 |

**අමතර තොරතුරු:**

- 2024.12.31 දිනට ඉතිරි තොගය රු. 60 000 කි.
- මාසික ගොඩනැගිලි කුලිය රු. 1 000 කි.
- බෙදාහැරීමේ රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 8% බැගින් ක්ෂය කළ යුතු ය.

**අවශ්‍ය වන්නේ :**

(අ) සාරධාගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2024.12.31 දිනට සාරධාගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka